# උතුරු එපින් ශ්‍රී ලාංකික එකමුතුව

වික්ටෝරියාවේ උතුරු එපින් ප්‍රදේශයේ අලුතින් සංවර්ධනය වන අවුරෝරා ලින්ඩරම් හා හේස්ටන් බුලවාඩ් ප්‍රදේශ වල ජීවත් වන ශ්‍රී ලාංකික පවුල් අතර සුහදතාව වර්ධනය කිරීමේ අරමුණෙන් එම පවුල් වල එකමුතුවක් පසුගියදා පැවැත්වුණි. ඉදිරියේදී ප්‍රදේශවාසී ශ්‍රී ලාංකිකයන්ගේ සහය ඇතිව සංස්කෘතික ආගමික හා විනෝදාත්මක වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීමට එහිදී තීරණය විය.

මෙම එකමුතුවේ දෙවන රැස්වීම පසුගිය ජනවාරි 26 වන දින අවුරෝරා උද්‍යානයේදී පැවැත්වුණි. මේ අවස්ථාවට අවට ප්‍රදේශ වල වෙසෙන සියලුම ශ්‍රී ලාංකිකයෝ සහභාගි වූහ.

ළබන මාර්තු 3 ඉරු දින උදෑසන 11 ට අවුරෝරා උද්‍යානයේදී පැවැත්වෙන මීළඟ සුහද හමුවට  සහභාගි වන මෙන් ප්‍රදේශවාසී ශ්‍රී ලාංකිකයන්ට මෙයින් ආරාධනය කෙරෙයි. වැඩි විස්තර සඳහා ශ්‍රියාණි (0432 077 038) හෝ ඉන්දික (0432 441 060) අමතන්න.








## දෙමව්පියනි

අපේ උරුමය භාෂාව හා සංස්කෘතිය ඔබේ දරුවාගේ මනසින් ගිලිහී නොයා රැක ගැනීම ඔබේ වගකීමක් නොවේ ද? පාරමිතා බෞද්ධ විහාරස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන සිංහල භාෂා පාසලට ඔබේ දරුවා ඇතුලත් කරන්න.

දරුවාගේ මනස පිනවන මාසික විවිධ ප්‍රසංග නාට්‍ය කවි ගීත වැනි විවිධ ක්‍රියාකාරකම් මගින් අපේ මව් බස ඔබේ දරුවාට ළඟා කිරීම අපේ වෑයමයි.
එය ඔබේ දරුවාට ප්‍රියජනක අද්දැකීමක් වන බව වසර ගණනාවක අපේ පළපුරුද්ද පෙන්වා දෙයි.

2012 වසර සඳහා සිසුන් බඳවා ගැනීම පෙබරවාරි 5 සිට ඇරඹෙයි.

**Taylors Lakes Secondary School**
39 Parmelia Dr Taylors Lakes
3038 (Melway 13J3)

**විමසීම්**
විහාරස්ථානය 03 9747 1902
බණ්ඩාරනායක (සංවිධායක)
0425 855621

